**දෙවන පාඩම**

## පරිසරය දකිමු ( 1.5)

- A 4 කඩදාසියක් ගෙන වර්ණ රේකා හැඩතල භාවිත කරමින් පහත දක්වා ඇති මාතෘකා වලින් එකක් තෝරාගෙන චිත්‍රයක් අදින්න .

1. පොල් රුප්පාවට සළ පායාගෙන පැමිණීම
2. මල්,කොළ,දළු,හැලුන ගසක්
3. නැගෙන රල සහිත වෙරල
4. දිය විසුරුවමින් ගල යන නදිය
5. අහසේ පායා ඇති දේදුන්න

**තෙවන පාඩම**

## පරිකල්පනය (2.5)

<u>**පරිකල්පන අභ්‍යාසයන්හි යෙදීම**</u>

**පරිකල්පනය යනු** අලුතින් යමක් නිර්මාණශීලීව සිතීමේ ශක්තිය යි. අපගේ පරිකල්පනය දියුණු කර ගැනීම සඳහා විවිධාකාරයේ අභ්‍යාසයන්හි නිරත විය හැකිය ඇතැම් රංග අභ්‍යාස,රංග ක්‍රීඩා,නවකතා කෙටි කතා කියවීම, ගීත රස විඳීම... ආදිය තුළින් අපගේ පරිකල්පන ශක්තිය දියුණු වේ.නාට්‍ය හා රංග කලාව හදාරන සිසුන් ලෙස පරිකල්පනය දියුණුකර ගැනීම සඳහා අපට රංග අභ්‍යාසයන්හි නිරත විය හැක.

<u>වෙද පුටුව රංග ආභ්‍යාසය</u>

ළමුන් සියලුම දෙනා රවුමට සිට ගැනීමට සලස්වන්න රවුම මැද පුටුවක් තැබිය යුතුය ඉන්පසු එක් ළමයකු යම්කිසි රෝගයක් වැළඳුණු අයෙකුගේ රෝග ලක්ෂණ අනුකරණය කරමින් පුටුව වෙත ගොස් වාඩි විය යුතු අතර වාඩි වූ පසු එම රෝගය සුව වේ ඉන්පසු නැවත වෙද පුටුවෙන් නැගිට වෙනත් රෝගයක් ඇති ලෙස අනුකරණය කළ යුතුය එම රෝගය පිටින්ම රෝගියා රවුමේ සිටින අයකු වෙත ගොස් ඔහුව ස්පර්ශ කළ විට ඔහුට එම රෝගය වැළඳී ඔහුද වෙද පුටුව වෙත යයි ෝග සුවවෙයි නැවත නැගිටින විට නැවත වෙනත් රෝගයක් වැළඳී ඉන් පසුව වෙනත් අයෙකු වෙත යයි ඔහු ස්පර්ශ කරයි ඔහුට ද එම රෝගය වැළඳී මේ ආකාරයට සියලුම සිසුන් සම්බන්ධ වන සේ මෙම රංග ක්‍රීඩාව කළ යුතුය

**පැවරුම-** පරිකල්පනය යන්න හඳුන්වන්න